**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ

පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස

සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) විදේශ ව්‍යවහාර බැංකු ගිණුමට අදාල පොලිය සහ විනිමය හුවමාරු ආදායම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 ප්‍රකාරව නිවැරැදිව හඳුනාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂයේ පොලී ආදායම රු. 105,483 ක් අඩුවෙන් සහ විදේශ විනිමය හුවමාරු වාසිය රු. 94,781 ක් වැඩියෙන් සටහන් වී තිබුණි. | 2018 වර්ෂයට අදාල පොලිය ඇ.ඩො. 718 ක් වී ඇති අතර ඇ.ඩො. 59.72 ක් පමණක් හඳුනා ගැනීම නිසා රු.105,483ක පොලී ආදායම වශයෙන් අඩුවෙන් දක්වා ඇත. මෙම වෙනස්කම් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කිරීම. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 ප්‍රකාරව විදේශ ව්‍යවහාර බැංකු ගිණුම්වලට අදාල පොලිය ගණනය කල යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව වත්කම්වල ඵලදායී ජීවිතකාලය නිවැරදිව තක්සේරු නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දැනට භාවිතයේ පවතින පිරිවැය රු.380,600 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රයෙහි සහ පිරිවැය රු.17,761,154 ක් වූ වාහන 05 හි ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කර සිදු වී ඇති ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරැදි කර ඉදිරිපත් කිරීම | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සම්පූර්ණයෙන්ම ක්ෂය කරනලද නමුත් දැනට භාවිතා කරන වත්කම් වල ඵලදායි ආයු කාලය තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.10,221,671 ක් වුවද විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ එම ආදායම රු. 10,326,436 ක් ලෙස දක්වා තිබීමෙන් පොලී ආදායම රු. 104,765 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ ස්ථාවර තැන්පතු කෙටිකාලීන අලුත්වීම සඳහා ආයෝජනය කර ඇති අතර අදාල වර්ෂය තුළ පොලී ප්‍රතිශතයන් වෙනස්වීම සිදු වේ. මෙම තැන්පතුව කල්පිරීමේදී පොළිය මුළු මුදලට එකතුවීම නිසා ක්‍රමානුකූලව ලැබෙන පොළී මුදලද වැඩිවීමක් සිදුවේ. | උපචිත පදනම මත ගිණුම් සකස්කරන බැවින් ගිණුම්කරණ කාලපරිච්ඡේදයට අදාල ආදායම නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ආ) වර්ෂයට අදාල ආදායම් බදු වටිනාකම ගනනය කිරීමේදී ප්‍රාග්ධන දීමනා සහ පාරිතෝෂික ගෙවීම් පිළිවෙලින් රු.30,700ක් සහ රු.260,831 ක් වැඩියෙන් සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල බදු වියදම සහ ගෙවිය යුතු බදු වටිනාකම රු. 81,625 ක් අඩුවෙන් සටහන් වී තිබුණි. | පැහැදිලි පිළිතුරක් ඉදිරිපත් කර නැත | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි විධිවිධාන වලට අනුව වර්ෂයට අදාල ආදායම් බදු වියදම ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයන්ට අදාලව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලැබිය යුතු කොමිස් මුදල් ඇතුලුව ලැබිය යුතු ශේෂයන්ගේ එකතුව රු. 1,978,919 ක් වී | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| තිබුණි. එම ශේෂය අයකර ගැනීමට කටයුතු නොකර සමාගමෙහි පරිපාලන වියදම් වෙනුවෙන් 2014 වර්ෂයේ රු.20,000,000 ක ණය මුදලක් කාර්යාංශයෙන් ලබාගෙන සමාලෝචිත වර්ෂයේදී ඉන් රු. 2,250,000 ක් පියවා තිබුණි. | | |
| (ආ) 2000 – 2010 කාල පරිච්ඡේදයන්ට අදාල ලැබිය යුතු රඳවාගැනීම් බදු ලෙස රු.1,118,392 ක ශේෂයක් සහ එකතු කල අගය මත බදු රු.1,340,633 ක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුනද එම ශේෂ නැවත අයකර ගැනීම අවිනිශ්චිතව පවතින බව ලිපිගොනු අනුව නිරීක්ෂණය විය. | අදාල ආයතන වෙත දැනුවත් කිරීම් කලද මේ වන විටත් ලැබී නැත. | මෙම ශේෂ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වීමෙන් සමාගමෙහි නිවැරදි මූල්‍ය තත්ත්වය නිරූපනය නොවන බැවින් එම ශේෂ කඩිනමින් නිරවුල් කර ගත යුතුව ඇත. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොරියාවෙහි රැකියා සඳහා විදේශගත වූ ශ්‍රමිකයන්ගෙන් නැවත ගෙවීමේ තැන්පතු ලෙස වර්ෂ 10 කට පෙර රු.50,000 බැගින් රඳවාගත් එකතුව රු.16,215,000 ක මුදලක් සහ මැලේසියාව බලා පිටත් කරන ලද ශ්‍රමිකයින් 241 කට ලබාදීම සඳහා එම රටෙහි සේවායෝජකයින් වෙතින් වර්ෂ 02 කට පෙර එවා තිබූ එකතුව රු1,904,322 ක වීසා ගාස්තු අදාල පුද්ගලයන් වෙත නැවත ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් ගෙවීම සඳහා මෙම ශේෂ ඉදිරියට ගෙන එමින් පවතී | රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයින්ගෙන් නැවත ගෙවීමේ පදනම මත රැස්කරගත් මෙම මුදල් කඩිනමින් ගෙවාදැමීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. |
| (ආ) විදේශ රැකියා සඳහා පිටත්ව එතෙරදී | කාර්යාංශය විසින් යැපෙන්නන් | එතෙරදී මිය ගිය ශ්‍රමිකයින් |

| | | |
|---|---|---|
| මිය ගිය ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් 2013 - 2018 කාලපරිච්ඡේදය තුල ඒජන්සියට ලැබුණු එකතුව රු. 8,273,415 ක් වූ මරණ වන්දි අදාල පාර්ශව වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි. | නිශ්චය කර ඉදිරිපත් නොකිරීම මත අදාල පාර්ශව වෙත ගෙවීමට ප්‍රමාද වීම. | වෙනුවෙන් ලැබී ඇති මෙම වන්දි මුදල් අදාල යැපෙන්නන් හඳුනාගෙන ඔවුන් වෙත ලබා දීමට කඩිනම් පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,648,781 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය 2,469,369 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,179,412 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාගමේ සමස්ථ ආදායම රු.7,787,156 කින් අඩු වුවද වෙනත් පරිපාලන වියදම් රු.10,322,336 කින් හා වෛද්‍ය මධ්‍යස්ථාන වියදම රු.1,892,000 කින් අඩු වීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාගමෙහි සමස්ත ආදායමින් සියයට 28 ක් ස්ථාවර තැන්පතු ආයෝජන මඟින් උපයන ලද පොලිය වු අතර ව්‍යාපාරික කටයුතු වලින් උපයන ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 7.46 කින් අඩු වී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විදේශ ගමන් වියදම්, වත්කම් ක්ෂය සහ වන්දි ගෙවීම් පිළිවෙලින් රු. 2,525,250 ක්, රු. 3,625,911 ක් හා රු. 2,250,103 කින් අඩුවී තිබුණු අතර මෙහෙයුම් ආදායම වූ රු. 24,460,137 කින් සියයට 72 ක් එනම් රු.17,536,936 ක් සේවක පිරිවැය වෙනුවෙන් වැයකර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

**3.1** **හඳුනාගත් පාඩු**

**-----------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | --------------------- | ------------ |
| (අ) | රැකියා සඳහා කොරියාව සහ ඊශ්‍රායලය වෙත පිටත්වන ශ්‍රමිකයන්ට වෛද්‍ය වාර්තා නිකුත් කිරීමේ අරමුණෙන් පුද්ගලික ආයතනයක් සමඟ ආරම්භ කරන ලද වෛද්‍ය මධ්‍යස්ථානය පිළිබඳ කටයුතු අවිධිමත්ව සිදුවීම හේතුවෙන් පහත සඳහන් පාඩු සමාගමට සිදුවී තිබුණි.<br>i. අදාල ගිණුමෙහි 17 වගන්තිය අනුව, සමාගම විසින් අදාල පුද්ගලික ආයතනය වෙත දැනුම් දුන් පසු ව්‍යාපාරික ස්ථානයෙන් ඉවත් විය යුතුවිය. එහෙත්, එම වෛද්‍ය මධ්‍යස්ථානය මගින් ලබාදුන් වෛද්‍ය වාර්තා විදේශ රාජ්‍යයන් වලින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන්, ව්‍යාපාරික කටයුතු නවතා දමන ලෙස 2016 සැප්තැම්බර් 26 දින එම පුද්ගලික ආයතනයට දන්වා තිබුණද, විගණන දිනය වූ 2019 ජූලි දක්වාම ව්‍යාපාරික කටයුතු නවතා එම ගොඩනැගිල්ලෙන් ඉවත් වී නොතිබුණි. | ඉන්සිලැබ් වෛද්‍ය මධ්‍යස්ථානයේ බලහත්කාරයෙන් රැඳී සිටින එහි අධ්‍යක්ෂක වරයා හේතුවෙන් බදු ගිවිසුමේ (f) වගන්තිය අනුව කටයුතු කිරිමට නොහැකි වී ඇත. එම ගොඩනැගිල්ල නිදහස් කර අදාල භුක්තිය හිමිකරු වෙත භාර දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | ව්‍යාපාරික කටයුතු අත්හිටුවා තිබියදීත් ගිවිසුම් ප්‍රකාරව ගොඩනැගිල්ල භාරදීමට සමාගම කටයුතු නොකිරීම පිළිබඳ අදාල වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | ii. ඉහත වෛද්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ හිමිකරු සහ විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම අතර ඇතිකරගත් කුලී ගිවිසුමෙහි (f) වගන්තිය අනුව, කුලී ගිවිසුම අවසන් කිරීමට කල්බදු ලාභියාට අවශ්‍ය වන අවස්ථාවකදී, ඒ බව මාස 3 ක ලිඛිත දැනුම්දීමකින් හෝ මාස 3 ක කුලී අත්තිකාරම් මුදල ගෙවා පූර්ව | ගොඩනැගිලි හිමිකරුගේ ඉල්ලීමට අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව එම මුදල වාරික 12 කින් ගෙවා ඇත. 2017.09.17 දිනෙන් පසු කිසිම මුදලක් ගෙවා නැත. | |

| | | | |
|---|---|---|---|
| | දැනුම්දීමකින් පසුව ගිවිසුම අවසන් කල හැකිව තිබුණි. එහෙත් ඒ අනුව කටයුතු නොකර කුලී ගිවිසුම අවසන් කල යුතුව තිබූ 2016 සැප්තැම්බර් සිට 2017 සැප්තැම්බර් දක්වා එකතුව රු. 2,640,000 ක ගොඩනැගිලි කුලී ලෙස නිෂ්කාර්යය වැයක් දරා තිබුණි. | | |
| iii. | විගණිත දිනය වූ 2019 ජූලි 05 දින වන විට කුලී ගිවිසුම අවසන් වී වර්ෂ 01 ක් සහ මාස 09 ක කාලයක් ඉක්ම ගොස් තිබුණද ගිවිසුම් ප්‍රකාරව රු. 600,000 ක අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නියමිත කාල වකවානුව තුල ගොඩනැගිල්ල නැවත භාරදීමට නොහැකි වූ බැවින් අත්තිකාරම් මුදල නැවත අය කර ගැනීමට නොහැකි විය. | වැඩිපුර ගෙවන ලද කුලී මුදල සහ අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විගමණික ශ්‍රමිකයින් වෙනුවෙන් සහන රක්ෂණ අරමුදලට අදාලව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා සමාගම අතර ඇති කරගත් ගිවිසුමේ රක්ෂණ ආවරණ කාලය අවුරුදු 02 ක් සහ මාස 01 ක් වුවත් කාර්යාංශය හා සමාගම සමඟ ඇති කරගත් ගිවිසුමේ රක්ෂණ ආවරණ කාලය අවුරුදු 2 ක් සහ මාස 03 ක් වී තිබුණි. එම සහන කාලය තුල රක්ෂිතයන්ට සිදු වූ හානි පූර්ණයේ වගකීම සමාගමට දැරීමට සිදු වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,600,000 ක් ඇතුලුව වර්ෂ 03 ක කාලපරිච්ඡේදයක් තුළ දී එකතුව රු. 7,024,940 ක අමතර වන්දි මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. | මෙම රක්ෂණ ක්‍රමයට අදාලව අත්සන් කර ඇති ගිවිසුමට අනුව, වන්දි මුදල් ගෙවීමේ වගකීම සමාගම සතු වූ බැවින් අදාල ගෙවීම් කර ඇත. | මෙම ගිවිසුම අත්සන් කිරීමේදී ඉදිරියේදී ඇති විය හැකි අවදානම සහ ඒ තුලින් සමාගමට සිදුවන මූල්‍යමය අලාභය පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. එමෙන්ම මෙම රක්ෂණ ක්‍රමය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට භාරදෙන අවස්ථාවේදී ඒවන විට රක්ෂණය වී ඇති සාමාජිකයන්ට වන්දි ගෙවන ආකාරය පිළිබඳ එකඟතාවයකට ඉහත කරුණු සම්බන්ධයෙන් නොපැමිණීමද ගැටලුවකි.<br>ඉහත කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීම නිසා සමාගමට සිදු වී ඇති මූල්‍ය අලාභයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවලියට අනුව, සමාගමට විදේශ රැකියා නියෝජිත ආයතනයක් ලෙස හා විදේශගතවන ශ්‍රමිකයන් පුහුණු කිරීම ඇතුළුව ක්ෂේත්‍රයට අදාලව පුළුල් පරාසයක කටයුතු කිරීමේ හැකියාව ලැබී තිබුණද, පසුගිය වර්ෂ කිහිපය තුල එහි ව්‍යාපාරික කටයුතු ක්‍රමානුකූලව බිඳවැටී සමාලෝචිත වර්ෂය වනවිට විදේශ රැකියා සඳහා ශ්‍රමිකයින් යොමුකිරීමට පමණක් සීමාවී තිබුණි. එම ව්‍යාපාරික කටයුත්තෙහිද සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා නොවීමෙන් සමාගම මූල්‍යමය වශයෙන් සහ පරිපාලනමය වශයෙන් අර්බුදකාරී තත්වයකට පත්ව තිබුණි. | ව්‍යාපාරික කටයුතු පුළුල්කරමින් සමාගම ලාභලබන තත්වයට ගෙන ඒමට කටයුතු කරමින් පවතී. | සමාගම පත්ව ඇති මූල්‍ය හා පරිපාලන අර්බුදකාරී තත්ත්වයට කඩිනම් විසඳුම් ලබා දීම කෙරෙහි කළමනාකරණයෙහි අවධානය යොමු විය යුතුය. |
| (ආ) 2018 වර්ෂයේ අවස්ථා 06 කදී සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වී තිබුණද පසුගිය වර්ෂවල විගණන වාර්තා මගින් පෙන්වා දී තිබූ ආකාරයට සමාගමෙහි මූල්‍ය හා පරිපාලන කටයුතු ක්‍රමානුකූලව බිඳ වැටෙමින් පැවතීම පිළිබඳව කළමනාකරණ අවධානය අවශ්‍ය පරිදි ලැබී නොතිබූ බව එම රැස්වීම් වාර්තා අධ්‍යයනය කිරීමේදී නිරීක්ෂණය විය. | ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | වාර්ෂික විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති කරුණු කෙරෙහි අවධානය යොමුකර ව්‍යාපාරයේ ඉදිරි පැවැත්මට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ඍජු සබඳතා මත සොයාගත් රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයන්ගෙන් නියෝජිත ගාස්තු අය කිරීම සඳහා අනුමත නිශ්චිත ක්‍රමවේදයක් නොතිබුණු අතර විවිධ අවස්ථාවල විවිධ පරිමාණයෙන් ගාස්තු අයකර තිබුණි. නියැදි පරීක්ෂාවට භාජනය වූ රැකියා ඇණවුම් 03 කට අදාලව රු.25,000 ක්, රු.29,113 ක් හා රු.33,261 ක් අයකර තිබීම නිදසුන් ලෙස දැක්විය හැක. | ප්‍රායෝගික තත්ත්වය සලකා බලා ගාස්තු තීරණය කර ඇත. | ගාස්තු අයකිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර අවශ්‍ය අනුමැතිය ලබාගත යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පසුගිය වර්ෂ 02 ක කාලපරිච්ඡේදය තුල සමාගම වෙත ලැබී ඇති රැකියා ඇණවුම් සංඛ්‍යාව 17 සිට 08 දක්වාද රැකියා අවස්ථා සංඛ්‍යාව 1235 – 839 දක්වාද ක්‍රමානුකූලව අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුල ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය හරහා විධිමත් පරිදි විදේශගත වූ මුළු ශ්‍රමික සංඛ්‍යාව 211,459 ක් වූ අතර ඉන් සමාගම විසින් සොයාගත් රැකියා සඳහා විගමණය කල ප්‍රමාණය 424 කි. එය සමස්ථ විගමණිකයන්ගෙන් සියයට 0.20 කි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ සමාගම විසින් සොයාගත් රැකියා අවස්ථා 760 කට ශ්‍රමිකයින් යොමුකිරීමට නොහැකි වී තිබුණි.පූර්ව වර්ෂවල සමාගම වෙත ලබා දුන් රැකියා ඇණවුම් සඳහා ශ්‍රමිකයන් යොමු නොකිරීම මත 2018 වර්ෂයේ කටාර් සහ කුවේට් යන රටවලින් රැකියා ඇණවුම් ලැබී නොතිබුණි. | සැලසුම්ගත වැඩසටහනක් අනුව ව්‍යාපාර දියුණුවට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | සමාගම වෙත නව රැකියා අවස්ථා ලබාගැනීමට සහ ලැබෙන රැකියා අවස්ථා සඳහා සුදුසු ශ්‍රමිකයින් යොමුකිරීමට කාර්යක්ෂම වැඩපිළිවෙළක් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුව ඇත. |

| | | |
|---|---|---|
| (ආ) ඊශ්‍රායිල් රාජ්‍ය සමඟ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු කිරීම සම්බන්ධව ඇති කරගත් ගිවිසුමට අනුව ඊශ්‍රායිල් රාජ්‍ය වෙත පිටත්ව යන ශ්‍රමිකයින්ගේ රැකියා බලපත්‍ර කාල සීමාව අවසන්වන විට තම රටට නැවත ගෙන්වා ගැනීමේ වගකීම සමාගම සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පැවරී තිබුණද වර්ෂ දෙකක් තුල නීති විරෝධී ලෙස ඊශ්‍රායල් රාජ්‍ය තුල රැදී සිටි ශ්‍රමිකයින් 105 ක් නැවත සිය රටට ගෙන්වා ගැනීමට හෝ ඔවුන්ගේ ඇපකරුවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සමාගමට නොහැකි වී තිබුණි.<br>එහෙත් රු.2,500,000 ක ඇප බැදුම්කරයක් තබා ඊශ්‍රායලයේ රැකියාවට ගොස් තම රැකියා කාල සීමාව නිමකර සිය රටට පැමිණ නැවත විගමණය වූ විගමනිකයන්ගෙන් ඉහත ඇප බැදුම්කරයට අමතරව රු.100,000 ක මුදල් ඇපයක් ගැනීමට සමාගම කටයුතු කර තිබුණි. | බලපත්‍ර කාලසීමාව අවසන්ව නීත්‍යානුකූල නොවන පරිදි එම රටෙහි රැදී සිටින ශ්‍රමිකයින් නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | රැකියා සඳහා විදේශ ගත වී නැවත නොපැමිණි ශ්‍රමිකයින් හෝ ඔවුන් වෙනුවෙන් ඇප බැදුම්කර සඳහා අත්සන් තබන ලද පුද්ගලයින් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කල යුතුය. තම රැකියා කාලසීමාව නිමකර නීත්‍යානුකූලව සියරටට පැමිණි ශ්‍රමිකයින් නැවත විදේශගත වීමට යාමේදී මෙසේ මුදල් ඇප තබා ගැනීමට කටයුතු කිරීම ඉහත ගැටලුවට විසදුමක්ද යන්න පිළිබඳව කළමනාකරණයෙහි අවධානය යොමු කල යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2013 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින සාමාන්‍යාධිකාරී තනතුර සඳහා සමාගමෙහි හෝ කාර්යාංශයෙහි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව කාර්යාංශයේ සභාපති විසින් අවස්ථා 10 කදී කාර්යාංශ නිළධාරීන් පත්කර තිබුණි.<br>2019 මාර්තු 15 දින පැවති රාජ්‍ය ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී මෙම ආයතනය සඳහා ස්ථිර පදනමින් සාමාන්‍යාධිකාරවරයෙකු බඳවා ගතයුතු බවට තීරණය වී තිබුණද | සමාගම මේ වන විට මූල්‍යමය වශයෙන් අසීරු තත්ත්වයක පවතින බැවින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්ය මණ්ඩලය වැඩ බැලීමේ පදනම මත සේවයේ යොදවා ගැනීම වාසිදායක බවට තීරණය වී ඇත. | රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාව දී ඇති නිර්දේශ පිළිබඳ අවධානය යොමුකර ස්ථිර පදනමින් සාමාන්‍යාධිකාරී වරයෙකු බඳවා ගැනීමට සහ අනෙකුත් පුරප්පාඩු පිරවීමටද අවශ්‍ය පියවර ගත යුතුය. |

විගණන දිනය වූ 2019 ජූනි 03 වන විටත් කාර්යාංශයේ නිළධාරියකු වැඩ බැලීමේ පදනම මත සේවය කරමින් පැවතුණි.

(ආ) එමෙන්ම අනුමත කාර්ය මණ්ඩලයට පරිභාහිරව ව්‍යාපාර සංවර්ධන උපදේශක ලෙස නිලධාරියකු බඳවාගෙන සේවයේ යෙදී සිටි කාලයට අදාලව කිසිදු කාර්යය පැවරීමකින් තොරව වැටුප ලෙස එකතුව රු.143,925 ක් වැය කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සකස්කර නොතිබුණි. | සැලසුම්ගත වැඩසටහනක් අනුව ව්‍යාපාර දියුණුවට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | තරඟකාරී ව්‍යාපාර කටයුත්තක නිරතවන මෙම සමාගම සඳහා පවතින දුර්වලතා, ව්‍යාපාරික අවශ්‍යතාවයන් මෙන්ම ව්‍යාපාරික තර්ජනයන් පිළිබඳ අවධානය යොමු කර, සමාගමෙහි අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට හැකිවන පරිදි, දිගු කාලීන දැක්මක් සහිත සංයුක්ත සැලැස්මක් සකස්කළ යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා සමාගම විසින් සකස් කල ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වැඩසටහන් 07 කට අදාල කාර්යයන් වර්ෂය තුල සැලසුම් කල පරිදි ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | මෙම වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ වැඩසටහන්ද ඇතුලත්ව ඉදිරි සැලසුම් සකස්කර ඇත. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම තාත්වික පදනමින් සකස් කළ යුතු අතර කාලීනව සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන ඇතුලත් කර සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |